# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,287 - 2022 ජූලි මස 01 වැනි සිකුරාදා - 2022.07.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : I වැනි ඡෙදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... ... | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... | — |

| | පිටුව |
|---|---|
| රජයේ නිවේදන ... ... ... | 912 |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 913 |
| නැවියන්ට දැන්වීම් ... ... ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක්ම ගැසට් පත්‍රය පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2022 ජූලි මස 22 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2022 ජූලි මස 08 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2022 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*


911 B 082359— 403 (2022/07)

# රජයේ නිවේදන

**කඹුරුපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය**

කඹුරුපිටිය, සපුගොඩ වාර්ෂික ඇසළ මහා පූජෝත්සවය - 2022

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, කුඹුරුපිටිය, සපුගොඩ, ඉලංගම්ගොඩ පුරාණ රජ මහා විහාරස්ථානයේ (සපුගොඩ පිරිවෙන) 2022 වාර්ෂික ඇසළ මහා පූජෝත්සවය 2022 ජූලි මස 18 වැනි දින සිට ජූලි මස 24 දක්වා පවත්වන බව වන්දනා ගමන් ආඥාපනත (175 පරිච්ඡේදය) යටතේ 1984 ජුනි මස 27 වැනි දින නිකුත් කරන ලද අංක 308 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද රෙගුලාසි අනුව මෙයින් දන්වමි.

කුසලක නානායක්කාර,
ප්‍රාදේශීය ලේකම්,
කඹුරුපිටිය.

2022 ජුනි මස 15 වැනි දින,
කුඹුරුපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

07-23

---

**මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

**වන්දනා ගමන් ආඥාපනත**

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, දෙවිනුවර ශ්‍රී විශ්ණු මහා දේවාලයේ 2021 වාර්ෂික ඇසළ උත්සවය 2022 අගෝස්තු මස 05 වැනි සිකුරාදා දින සිට අගෝස්තු මස 12 වැනි සිකුරාදා දින දක්වා පවත්වනු ලබන බව වන්දනා ගමන් ආඥාපනතේ (175 පරිච්ඡේදය) රෙගුලාසිවල 10 වන වගන්තිය අනුව 1959 නොවැම්බර් මස 20 වැනි දින නිකුත් කරන ලද අංක 11959 දරන ලංකාණ්ඩුවේ *ගැසට් පත්‍රය* යටතේ මෙයින් දන්වමි.

වයි. වික්‍රමසිරි,
දිස්ත්‍රික් ලේකම්/ දිසාපති,
මාතර.

2022 ජුනි මස 22 වැනි දින,
මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දී ය.

07-45

---

**ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - මුලතිව්**

ඔඩ්ඩුසුඩ්ඩාන් තාන්තෝන්රීස්වරර් කෝවිල් උත්සවය - 2022

**මුලතිව් දිස්ත්‍රික්කය**

ඉහත සඳහන් උත්සවය 2022 ජුනි මස 28 වැනි දින පෙ. ව. 6.00ට ආරම්භ කර 2022 ජූලි මස 13 වැනි දින ප. ව. 6.00ට අවසන්වන බව පොදු මහජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් නිවේදනය කරනු ලැබේ.

01. මේ පිළිබඳව 1949 මැයි මස 27 වැනි දින අංක 9978 හා 1950 මැයි මස 26 වැනි දිනැති අංක 10105 දරන රෙගුලාසිවලට පොදු ජනතාවගේ අවධානය යොමු කරවනු ලැබේ.

02. ප්‍රසිද්ධියට පත් කරන ලද මෙම නිත්‍ය රෙගුලාසි උත්සවය පැවැත්වෙන කාල සීමාව තුළ වලංගුවනවා ඇත.

පී. ජෙයරාණි මිය,
ප්‍රාදේශීය ලේකම්.

ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
ඔඩ්ඩුසුඩ්ඩාන්,
මුලතිව්,
2022 ජුනි මස 20 වැනි දින.

07-46

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - පුත්තලම ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතයයි

වර්ල්ඩ් එක්ස්ප්‍රස් කන්සල්ටින් කෝපරේෂන් කලම්බු (ප්‍රයිවට්) ලිමිටඩ්

2022 මැයි මස 26 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමකදී පහත දැක්වෙන පරිදි විශේෂයෙන් හා ඒකමතිකව යෝජනා සම්මත කරගන්නා ලදී.

හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී විසින් වර්ල්ඩ් එක්ස්ප්‍රස් කන්සල්ටින් කෝපරේෂන් කලම්බු (ප්‍රයිවට්) ලිමිටඩ් වෙත ප්‍රදානය කරන ලද රු. 5,695,000.00ක ප්‍රතිව්‍යුහගත කරන ලද වාරික ණයක් ආපසු ගෙවීම සඳහා සුරක්ෂිතයක් වශයෙන් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි වාසියට, මීගමුව ප්‍රසිද්ධ නොතාරිස් ජී. එම්. එම්. ප්‍රනාන්දු විසින් ලියා සහතික කරන ලද අංක 5897 හා 2017.07.14 සහ අංක 5992 හා 2017.10.11 දින දරන උකස් බැඳුම්කරය මගින් වර්ල්ඩ් එක්ස්ප්‍රස් කන්සල්ටින් කෝපරේෂන් කලම්බු (ප්‍රයිවට්) ලිමිටඩ් ණයකරු වශයෙන් සහ සුබෝධා වික්‍රමබාහු සෙනරත් පරනයාපා සිල්වා උකස්කරු වශයෙන් මෙහි උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ උකස්කර බැඳතබා තිබේ.

තව ද, සුබෝධා වික්‍රමබාහු සෙනරත් පරනයාපා සිල්වා යන අය, ඉහත කී වර්ල්ඩ් එක්ස්ප්‍රස් කන්සල්ටින් කෝපරේෂන් කලම්බු (ප්‍රයිවට්) ලිමිටඩ් හි නියම හිමිකරුවන අතර, ඉහත කී සුබෝධා වික්‍රමබාහු සෙනරත් පරනයාපා සිල්වා යන අය වර්ල්ඩ් එක්ස්ප්‍රස් කන්සල්ටින් කෝපරේෂන් කලම්බු (ප්‍රයිවට්) ලිමිටඩ් හි අධ්‍යක්ෂවරයකු වශයෙන් එකී සමාගම පාලනය කරයි සහ කළමණාකරණය කරන අතර, ඒ අනුව සමාගමේ ආයතනික වැස්ම නිරාවරණය කළහොත්, එවිට එකී සුබෝධා වික්‍රමබාහු සෙනරත් පරනයාපා සිල්වා යන අය හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී විසින් වර්ල්ඩ් එක්ස්ප්‍රස් කන්සල්ටින් කෝපරේෂන් කලම්බු (ප්‍රයිවට්) ලිමිටඩ් වෙත ප්‍රදානය කරන ලද මූල්‍ය පහසුකමේ සත්‍ය ප්‍රතිලාභියා වේ.

තව ද, වර්ල්ඩ් එක්ස්ප්‍රස් කන්සල්ටින් කෝපරේෂන් කලම්බු (ප්‍රයිවට්) ලිමිටඩ් සහ සුබෝධා වික්‍රමබාහු සෙනරත් පරනයාපා සිල්වා යන අය විසින් එකී බැඳුම්කර මත සහ එකී රු. 5,695,000.00ක ප්‍රතිව්‍යුහගත කරන ලද වාරික ණය මත හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති අතර, ඒ අනුව දැන් එකී බැඳුම්කරය මත 2022 අප්‍රේල් 01 වැනි දිනට රුපියල් මිලියන හයයි දෙදහස් දෙසිය විසි හතරයි ශත දහතුන (රු. 6,002,224.13)ක මුදලක් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති අතර, ඒ අනුව කරන ලද ගෙවීම් (ඇත්නම්) ඒවා අඩුකොට, විකුණුම් දිනය දක්වා රු. 5,695,000.00ක ප්‍රාග්ධන හිඟය මත 2022 අප්‍රේල් 02 වැනි දින සිට වර්ෂයකට AWPLR + 3% (වර්ෂයකට 12.46%)ක අනුපාතයකට තවදුරටත් පොළිය ද සමග එකී රු. 6,002,224.13ක මුදල සහ ප්‍රචාරණ පිරිවැය සහ දරන ලද අනෙකුත් ගාස්තු අයකර ගැනීම සඳහා එකී අංක 5897 හා 5992 දරන බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත උකස්කරන ලද සහ මෙහි උපලේඛනයේ විස්තර කර ඇති දේපළ, මුළු දීවයිනටම බලයලත් වෙන්දේසිකරු එල්. බී. සේනානායක මගින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙමගින් යෝජනා සම්මත කරගනී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරළේ, රාගම් පත්තුවේ, ජා ඇල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ ජා ඇල ප්‍රාදේශීය සභාවේ, රාගම ඒකකය තුළ 181බී - රාගම ග්‍රාම නිලධාරි වසම තුළ රාගම පිහිටි "හික්ගහවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එල්. ගුණසේකර විසින් මැන සාදන ලද අංක 1926 හා 2002.06.30 දින දරන පිඹුරේ ලොට් බී වශයෙන් ලකුණු කර ඇති බෙදාවෙන්කරන ලද ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : සීජීආර් ඉඩම, රජයේ ඉඩම ද, නැගෙනහිරට : පාර ද, දකුණට : ලොට් සී (අඩි 10ක් පළල පාර සඳහා වෙන් කිරීම) සහ බස්නාහිරට : ලොට් ඒ ද මායිම් වූ පර්චස් දහනමයයි දශම පහයි බිංදුව (පර්. 19.50)ක් විශාලත්වයෙන් යුත් ඉඩම සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි ඇතුළු සෑම සියලු දේද වේ.

තව ද, එකී අංක 1926 දරන පිඹුරේ පෙන්වා ඇති ලොට් සී (අඩි 10ක් පළල පාර සඳහා වෙන්කිරීම) දිගේ සහ ඒ මතින් ඇති මාර්ග අයිතිය සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි.

කේ. ඒ. එල්. ටී. රණවීර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි,
(නීති)/මාණ්ඩලික ලේකම්.

07 - 15/1

## හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - පැලියගොඩ ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතයයි

මහ ශක්ති සිමෙන්ට් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්

2022 මැයි මස 26 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමකදී පහත දැක්වෙන පරිදි විශේෂයෙන් හා ඒකමතිකව යෝජනා සම්මත කරගන්නා ලදී.

හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී විසින් මහ ශක්ති සිමෙන්ට් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් වෙත ප්‍රදානය කරන ලද රු. 50,000,000ක ආනයන ණයක් ආපසු ගෙවීම සඳහා සුරක්ෂිතයක් වශයෙන් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි වාසියට, කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එච්. ජී. එස්. අනුරාධි විසින් ලියා සහතික කරන ලද අංක 438 හා 2019.01.30 දින දරන උකස් බැඳුම්කරය මගින් මහ ශක්ති සිමෙන්ට් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් ණයකරු වශයෙන් සහ කලහෙ පාඬිකෝරළලාගේ විදුර කීර්ති ලංකානාත් කරුණාගො ාඩ උකස්කරු වශයෙන් මෙහි උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ උකස්කර බැඳතබා තිබේ.

හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී විසින් මහ ශක්ති සිමෙන්ට් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් වෙත ප්‍රදානය කරන ලද රු. 5,000,000ක ස්ථාවර අයිරාවක් ආපසු ගෙවීම සඳහා සුරක්ෂිතයක් වශයෙන් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි වාසියට, කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එච්. ජී. එස්. අනුරාධි විසින් ලියා සහතික කරන ලද අංක 438 හා 2019.01.30 දින දරන උකස් බැඳුම්කරය මගින් මහ ශක්ති සිමෙන්ට් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් ණයකරු වශයෙන් සහ කලහෙ පාඬිකෝරළලාගේ විදුර කීර්ති ලංකානාත් කරුණාගොඩ උකස්කරු වශයෙන් මෙහි උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ උකස්කර බැඳතබා තිබේ.

කලහෙ පාඬිකෝරළලාගේ විදුර කීර්ති ලංකානාත් කරුණාගොඩ යන අය, ඉහත කී මහ ශක්ති සිමෙන්ට් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් හි නියම හිමිකරුවන අතර, ඉහත කී කලහෙ පාඬිකෝරළලාගේ විදුර කීර්ති ලංකානාත් කරුණාගොඩ යන අය මහ ශක්ති සිමෙන්ට් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් හි අධ්‍යක්ෂවරයකු වශයෙන් එකී සමාගම පාලනය කරයි සහ කළමණාකරණය කරන අතර, ඒ අනුව සමාගමේ ආයතනික වැස්ම නිරාවරණය කළහොත්, එවිට කලහෙ පාඬිකෝරළලාගේ විදුර කීර්ති ලංකානාත් කරුණාගොඩ යන අය හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී විසින් මහ ශක්ති සිමෙන්ට් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් වෙත ප්‍රදානය කරන ලද මූල්‍ය පහසුකමේ සත්‍ය ප්‍රතිලාභියා වේ.

තව ද, මහ ශක්ති සිමෙන්ට් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් සහ කලහෙ පාඬිකෝරළලාගේ විදුර කීර්ති ලංකානාත් කරුණාගොඩ යන අය, එකී බැඳුම්කරය මත හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති අතර, ඒ අනුව දැන් එකී බැඳුම්කරය මත 2022 අප්‍රේල් 04 වැනි දිනට රු. 21,845,869.30 සහ රු. 6,808,498.27ක් එකතුව රු. 2,654,367.57 (රුපියල් මිලියන විසි අටයි හය ලක්ෂ පනස් හතර දහස් තුන්සිය හැට හතයි ශත පනස් හත)ක මුදලක් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත ගෙවිය යුතුව සහ අයවිය යුතුව ඇති අතර, ඒ අනුව කරන ලද ගෙවීම් (ඇත්නම්) ඒවා අඩුකොට, විකුණුම් දිනය දක්වා රු. 20,805,131.50ක් සහ ප්‍රාග්ධන හිඟය මත 2022 අප්‍රේල් 05 වැනි දින සිට වර්ෂයකට AWPLR+ 3.25% (වර්ෂයකට 13.10%)ක අනුපාතයට තවදුරටත් පොළිය ද සමග එකී රු. 21,845,869.30ක මුදල සහ 2022 අප්‍රේල් 05 වැනි දින සිට වර්ෂයකට AWPLR+ 3.25% (වර්ෂයකට 12.46%) ක අනුපාතයට තවදුරටත් පොළිය ද සමග එකී රු. 6,808,498.27ක මුදල සහ ප්‍රචාරණ පිරිවැය සහ දරන ලද අනෙකුත් ගාස්තු අයකරගැනීම සඳහා එකී අංක 438 දරන බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත උකස්කරන ලද සහ මෙහි උපලේඛනයේ විස්තර කර ඇති දේපළ, මුළු දිවයිනටම බලයලත් වෙන්දේසිකරු කේ. පී. එන්. සිල්වා මගින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙමගින් යෝජනා සම්මත කරගනී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ කඩුවෙල මහනගර සභා සීමාව තුළ අංක 494සී - හෝකන්දර දකුණ ග්‍රාම නිලධාරි වසම තුළ, වරිපනම් අංක 191 - දක්ෂිණ මාවත දරන හෝකන්දර දකුණ පිහිටි "දවටගහලන්ද *හෙවත්* දියපරගහදෙනිය" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩී. පී. ඒ. ජයසිංහ විසින් මැන සාදන ලද අංක 1493 හා 1960 සැප්තැම්බර් 25 දින දරන පිඹුරේ ලොට් 02 වශයෙන් ලකුණු කර ඇති බෙදාවෙන්කරන ලද ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට ඃ ලොට් 1 ද, නැගෙනහිරට ඃ වී. සී. පාර ද, දකුණට ඃ වී. සී. පාර සහ බස්නාහිරට ඃ පී. පිලිප් පෙරේරාගේ දවටගහලන්ද *හෙවත්* දියපරගහදෙනිය ලන්ද ද මායිම් වූ අක්කර එකයි පර්චස් දාහතයි දශම පහයි බිංදුව (අ.1, පර්. 17.50)ක් විශාලත්වයෙන් යුත් ඉඩම සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි ඇතුළු සෑම සියලු දේද වේ.

ඉහත කී ලොට් 2, නැවත මනින ලද අතර, එය පහත සඳහන් පරිදි විස්තර කෙරේ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ කඩුවෙල මහනගර සභා සීමා තුළ අංක 494සී - හෝකන්දර දකුණ ග්‍රාම නිලධාරි වසම තුළ, වරිපනම් අංක 191 - දක්ෂිණ මාවත දරන හෝකන්දර දකුණ පිහිටි "දවටගහලන්ද *හෙවත්*දියපරගහදෙනිය" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු

පී. එච්. පෙරේරා විසින් මැන සාදන ලද අංක 3409 හා 2012 ඔක්තෝබර් 03 දින දරන පිඹුරේ ලොට් ඒ වශයෙන් ලකුණු කර ඇති බෙදාවෙන්කරන ලද ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : පී. ඒ. ලයනල් පෙරේරා හිමිකම්පාන අංක 1493 දරන පිඹුරේ ලොට් 1 ද, නැගෙනහිරට : පී. ඒ. ලයනල් පෙරේරා හිමිකම්පාන අංක 1493 දරන පිඹුරේ ලොට් 1 සහ මීටර් 5.5ක පාර ද, දකුණට : මීටර් 4.5ක පාර සහ බස්නාහිරට : පී. ධරමදාස පෙරේරා හිමිකම්පාන දවටගහලන්ද *හෙවත්* දියපරගහදෙනිය ලන්ද ද මායිම් වූ අක්කර එකයි පර්චස් දහහතයි දශම පහයි බිංදුව (අ.1, රූ.0, පර්.17.50)ක් විශාලත්වයෙන් යුත් ඉඩම සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි ඇතුළු සෑම සියලු දේද වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි.

කේ. ඒ. එල්. ටී. රණවීර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි
(නීති)/මාණ්ඩලික ලේකම්.

07 - 15/2

---

## හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - මීගමුව ශාඛාව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතයයි

යසශ්‍රී රෝෂිනි සිරිසේන
'නීඩ්ස් ලංකා එන්ටප්‍රර්යිසස්' හි තනි අයිතිකාරිය

2022 මැයි මස 26 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමකදී පහත දැක්වෙන පරිදි විශේෂයෙන් හා ඒකමතිකව යෝජනා සම්මත කරගන්නා ලදී.

හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී විසින් 'නීඩ්ස් ලංකා එන්ටප්‍රර්යිසස්' හි තනි අයිතිකාරිය වන යසශ්‍රී රෝෂිනි සිරිසේන වෙත ප්‍රදානය කරන ලද රු. 5,971,730.04ක ප්‍රතිව්‍යුහගත කරනලද ප්‍රාග්ධන ණයක් ආපසු ගෙවීම සඳහා සුරක්ෂිතයක් වශයෙන් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි වාසියට, මීගමුව ප්‍රසිද්ධ නොතාරිස් ජී. එම්. එම්. ප්‍රනාන්දු විසින් ලියා සහතික කරන ලද අංක 5751 හා 2017.03.07 දින දරන සහ අංක 5785 හා 2017.04.04 දින දරන සහ අංක 6040 හා 2017.11.24 දින දරන උකස් බැඳුම්කරය මගින් 'නීඩ්ස් ලංකා එන්ටප්‍රර්යිසස්' හි තනි අයිතිකාරිය වන යසශ්‍රී රෝෂිනි සිරිසේන ණයකරු වශයෙන් මෙහි උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ උකස්කර බැඳතබා තිබේ.

තව ද, එකී යසශ්‍රී රෝෂිනි සිරිසේන යන අය විසින් එකී බැඳුම්කර මත සහ එකී රු. 5,971,730.04ක ප්‍රතිව්‍යුහගත කරන ලද ප්‍රාග්ධන ණය මත හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති අතර, ඒ අනුව දැන් එකී බැඳුම්කර මත 2022 අප්‍රේල් 03 වැනි දිනට රුපියල් මිලියන හයයි එක් ලක්ෂ තිස් පන් දහස් දෙසිය අසූ හතයි ශත හැට හත (රු. 6,135,287.67)ක මුදලක් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති අතර, ඒ අනුව කරන ලද ගෙවීම් (ඇත්නම්) ඒවා අඩුකොට, විකුණුම් දිනය දක්වා රු. 5,799,322.81ක ප්‍රාග්ධන හිඟය මත 2022 අප්‍රේල් 04 වැනි දින සිට වර්ෂයකට 10%ක අනුපාතයට තවදුරටත් පොළිය ද සමග එකී රු. 6,135,287.67ක මුදලක් ප්‍රචාරණ පිරිවැය සහ දරන ලද අනෙකුත් ගාස්තු ද සමග අයකර ගැනීම සඳහා එකී අංක 5751, 5785 සහ 6040 දරන බැඳුම්කර මගින් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත උකස්කරන ලද සහ මෙහි උපලේඛණයේ විස්තර කර ඇති දේපළ, මුළු දිවයිනටම බලයලත් වෙන්දේසිකරු ඩී. කෙලාට් මගින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙමගින් යෝජනා සම්මත කරගනී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ (මීගමුව ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ) අලුත්කුරු කෝරළේ, දූනගහ පත්තුවේ, කටාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ කටාන ප්‍රාදේශීය සභා සීමාව තුළ 93බී - හොරගස්මුල්ලේ කටියාල ග්‍රාම නිලධාරී වසම තුළ දෙමන්හන්දියේ සහ කොන්ගොඩමුල්ලේ පිහිටි "ග්‍රේස්ලන්ඩ් එස්ටේට්" නමැති ඉඩමට බලයලත් මිනින්දෝ ඩී. ඩී. හෙට්ටිගේ විසින් සාදන ලද අංක 2789 හා 1992.11.07 දින දරන පිඹුරේ ලොට් 14 වශයෙන් ලකුණු කර ඇති බෙදා වෙන්කරන ලද ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : ජෝකින් හෙයින්ස්ගේ ඉඩම ද, නැගෙනහිරට : ලොට් 11, ලොට් 12 සහ ලොට් 80 (අඩි 10ක් පළල පාර සඳහා වෙන් කිරීම) ද, දකුණට : ලොට් 15 සහ ලොට් 80 (අඩි 10ක් පළල පාර සඳහා වෙන් කිරීම) සහ බස්නාහිරට : ජෝකින් හෙයින්ස්ගේ ඉඩම ද මායිම් වූ පර්චස් විස්ස (පර්. 20) විශාලත්වයෙන් යුත් ඉඩම සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි ඇතුළු සෑම සියලු දේද සමග වේ.

ඉහත සඳහන් දේපළ මෑතකදී මැනීමකට ලක්කරන ලද අතර, එය බලයලත් මිනින්දෝරු ජේ. ඒ. ඩබ්. කාවල් හෝ විසින් සාදන ලද අංක 87/2012 හා 2012.06.02 දින දරන පිඹුරේ දක්වා ඇති අතර, එය පහත සඳහන් පරිදි විස්තර කෙරේ.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ (මීගමුව ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ) අලුත්කුරු කෝරළේ, දූනගහ පත්තුවේ, කටාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ කටාන ප්‍රාදේශීය සභා සීමාව තුළ 93බී - හොරගස්මුල්ලේ කටියාල ග්‍රාම නිලධාරී වසම තුළ දෙමන්හන්දියේ සහ කොන්ගොඩමුල්ලේ පිහිටි "ග්‍රේස්ලන්ඩ් එස්ටේට්" නමැති ඉඩමට සාදන ලද අංක 87/2012 දරන එකී පිඹුරේ ලොට් 14ඒ වශයෙන් ලකුණු කර ඇති බෙදා වෙන්කරන ලද ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : ජෝකින් හෙයින්ස්ගේ ඉඩම ද, නැගෙනහිරට : මනෝජ් සහ තවත් අයගේ ඉඩම ද, දකුණට : අඩි 10ක් පළල පාර සඳහා

වෙන් කිරීම සහ රවී ලියනගේ ගේ ඉඩම සහ බස්නාහිරට : රවී ලියනගේ සහ ජෝකින් හෙයින්ස්ගේ ඉඩම ද මායිම් වූ පර්චස් විස්සයි දශම හය (පර්. 20.6) විශාලත්වයෙන් යුත් ඉඩම සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි ඇතුළු සැම සියලු දේද සමග වේ.

තව ද, එකී අංක 2789 දරන පිඹුරේ දක්වා ඇති ලොට් 80, 78, 79, 85 සහ 83 දිගේ හා ඒ මතින් වන මාර්ග අයිතිය ද සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි.

කේ. ඒ. එල්. ටී. රණවීර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි
(නීති)/මාණ්ඩලික ලේකම්.

07 - 15/3

---

## හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - මීගමුව ශාඛාව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතයයි

ඇතිගේ මහේෂ් ප්‍රදීප් සිල්වා

2022 මැයි මස 26 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමකදී පහත දැක්වෙන පරිදි විශේෂයෙන් හා ඒකමතිකව යෝජනා සම්මත කරගන්නා ලදී.

හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී විසින් ඇතිගේ මහේෂ් ප්‍රදීප් සිල්වා වෙත අනිකුත් පහසුකම් අතර ප්‍රදානය කරන ලද රු. 17,241,319.55ක සංවර්ධන ණය පහසුකම I ආපසු ගෙවීම සඳහා සුරක්ෂිතයක් වශයෙන් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි වාසියට, මීගමුව ප්‍රසිද්ධ නොතාරිස් ජී. එම්. එම්. ප්‍රනාන්දු විසින් ලියා සහතික කරන ලද අංක 6332 හා 2018.09.28 දින දරන උකස් බැඳුම්කරය මගින් ඇතිගේ මහේෂ් ප්‍රදීප් සිල්වා ණයකරු වශයෙන් මෙහි පළමුවන උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ උකස්කර බැඳතබා ඇති අතර, ඒ අනුව එතෙක් ගෙවා ඇති යම් ගෙවීම් (ඇත්නම්) ඒවා අඩුකොට, රු. 17,241,319.55ක ප්‍රාග්ධන හිඟය මත විකුණුම් දිනය දක්වා වර්ෂයකට AWPLR+ 2.5% (වර්ෂයකට 11.96%)ක අනුපාතයට තවදුරටත් පොළියද සමග, 2022 අප්‍රේල් 22 වැනි දිනට රු. 18,033,778.07ක මුදලක් ප්‍රචාරණ පිරිවැය සහ දරන ලද අනෙකුත් ගාස්තු ද සමග බැංකුව වෙත අයවිය යුතුව සහ ගෙවිය යුතුව තිබේ.

හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී විසින් ඇතිගේ මහේෂ් ප්‍රදීප් සිල්වා වෙත අනිකුත් පහසුකම් අතර ප්‍රදානය කරන ලද රු. 5,531,000.00ක සංවර්ධන ණය පහසුකමක් III ආපසු ගෙවීම සඳහා සුරක්ෂිතයක් වශයෙන් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි වාසියට, මීගමුව ප්‍රසිද්ධ නොතාරිස් ජී. එම්. එම්. ප්‍රනාන්දු විසින් දෙකම ලියා සහතික කරන ලද අංක 6332 හා 2018.09.28 දින දරන සහ අංක 7103 සහ 2021.06.23 දින දරන උකස් බැඳුම්කර මගින් ඇතිගේ මහේෂ් ප්‍රදීප් සිල්වා ණයකරු වශයෙන් මෙහි පළමුවන උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ උකස්කර බැඳතබා ඇති අතර, ඒ අනුව ලද ගෙවීම් (ඇත්නම්) අඩුකොට, රු. 5,531,000.00ක ප්‍රාග්ධන හිඟය මත, විකුණුම් දිනය දක්වා වර්ෂයකට AWPLR+ 2.5% (වර්ෂයකට 11.96%)ක අනුපාතයට තවදුරටත් පොළියද සමග, 2022 අප්‍රේල් 22 වැනි දිනට රු. 5,780,214.87ක මුදලක් ප්‍රචාරණ පිරිවැය සහ දරන ලද අනෙකුත් ගාස්තු ද සමග බැංකුව වෙත අයවිය යුතුව සහ ගෙවිය යුතුව තිබේ.

හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී විසින් ඇතිගේ මහේෂ් ප්‍රදීප් සිල්වා වෙත අනිකුත් පහසුකම් අතර ප්‍රදානය කරන ලද රු. 12,483,736.87ක සංවර්ධන ණය පහසුකමක් II ආපසු ගෙවීම සඳහා සුරක්ෂිතයක් වශයෙන් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි වාසියට, මීගමුව ප්‍රසිද්ධ නොතාරිස් ජී. එම්. එම්. ප්‍රනාන්දු විසින් ලියා සහතික කරන ලද අංක 5968 හා 2017.09.19 දින දරන සහ අංක 6333 සහ 2018.09.28 දින දරන උකස් බැඳුම්කර මගින් ඇතිගේ මහේෂ් ප්‍රදීප් සිල්වා ණයකරු වශයෙන් මෙහි දෙවන උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ උකස්කර බැඳතබා ඇති අතර, ඒ අනුව කරන ලද ගෙවීම් (ඇත්නම්) ඒවා අඩුකොට, රු. 12,483,736.87ක ප්‍රාග්ධන හිඟය මත, විකුණුම් දිනය දක්වා වර්ෂයකට AWPLR+ 2.5% (වර්ෂයකට 11.96%)ක අනුපාතයට තවදුරටත් පොළියද සමග, 2022 අප්‍රේල් 22 වැනි දිනට රු. 13,044,291.48ක මුදල, ප්‍රචාරණ පිරිවැය සහ දරන ලද අනෙකුත් ගාස්තු ද සමග බැංකුව වෙත අයවිය යුතුව සහ ගෙවිය යුතුව තිබේ.

තව ද, එකී ඇතිගේ මහේෂ් ප්‍රදීප් සිල්වා යන අය විසින් එකී බැඳුම්කර මත සහ සම්පූර්ණයෙන්ම රු. 35,256,056.42ක එකී සංවර්ධන ණය පහසුකම් මත හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති අතර, ඒ අනුව දැන් එකී බැඳුම්කර මත 2022 අප්‍රේල් 22 වැනි දිනට රු. 36,858,284.42 (රුපියල් මිලියන තිස් හයයි අට ලක්ෂ පනස් අට දහස් දෙසිය අසූ හතරයි ශත හතලිස් දෙක)ක මුදලක් පමණක් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති අතර, ඒ අනුව, කරන ලද ගෙවීම් (ඇත්නම්) ඒවා අඩුකොට, විකුණුම් දිනය දක්වා එකතුව රු. 35,256,056.42ක ප්‍රාග්ධන හිඟය මත වර්ෂයකට AWPLR+ 2.5% (වර්ෂයකට 11.96%)ක අනුපාතයට තවදුරටත් පොළියද සමග එකී රු. 36,858,284.42ක මුදල සහ ප්‍රචාරණ පිරිවැය සහ දරන ලද අනෙකුත් ගාස්තු ද සමග අයකරගැනීම සඳහා එකී අංක 6332, 5968, 6333 සහ 7103 දරන බැඳුම්කර මගින් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත උකස්කරන ලද සහ මෙහි උපලේඛනයේ විස්තර කර ඇති දේපළ, මුළු දිවයිනටම බලයලත් වෙන්දේසිකරු කේ. පී. එන්. සිල්වා මගින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු

බවට, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙමගින් යෝජනා සම්මත කරගනී.

### පළමුවන උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ (මීගමුව ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ) මීගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ මීගමුව මහනගර සභා සීමාවේ කොච්චිකඩේ උපකාර්යාල සීමාව තුළ 72-දළුපොත ග්‍රාම නිලධාරී වසම තුළ දළුපොත පිහිටි "මිල්ලගහවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ආර්. අයි. ප්‍රනාන්දු විසින් සාදන ලද අංක 895 හා 1981.04.07 දින දරන පිඹුරේ ලොට් 1 වශයෙන් ලකුණු කර ඇති බෙදා වෙන්කර ලද ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : මහ පාර ද, නැගෙනහිරට : වී. සී. පාර ද, දකුණට : ලොට් 2 සහ බස්නාහිරට: ඩබ්. ඇන්ජලින් ප්‍රනාන්දුගේ ඉඩම ද, මායිම් වූ පර්චස් අටයි දශම නමයයි හතර (පර්.8.94) විශාලත්වයෙන් යුත් ඉඩම සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි ඇතුළු සෑම සියලු දේද සමග වේ.

ඉහත සඳහන් දේපළ මෑතකදී නැවත මැනීමකට ලක්කරන ලද අතර, ඒ අනුව එය, බලයලත් මිනින්දෝරු ඩී. පී. විමලසේන විසින් සාදන ලද අංක 10006 හා 2016.05.18 දින දරන පිඹුරේ දක්වා ඇති අතර, එය පහත සඳහන් පරිදි විස්තර කෙරේ:

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ (මීගමුව ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ) මීගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ මීගමුව මහනගර සභා සීමාවේ කොච්චිකඩේ උපකාර්යාල සීමාව තුළ 72-දළුපොත ග්‍රාම නිලධාරී වසම තුළ දළුපොත පිහිටි "මිල්ලගහවත්ත" නමැති ඉඩමට සාදන ලද එකී අංක 10006 දරන පිඹුරේ ලොට් 1 වශයෙන් ලකුණු කර ඇති බෙදා වෙන්කරන ලද ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : තිඹිරිගස්කටුව පාර ද, නැගෙනහිරට : පිලැව පාර ද, දකුණට : කේ. එච්. ලක්ෂ්මන් පෝල් ප්‍රනාන්දු හිමිකම්පාන ඉඩම (අංක 895 පිඹුරේ ලොට් 2) සහ බස්නාහිරට : චමින්ද ප්‍රනාන්දු හිමිකම්පාන ඉඩම ද මායිම් වූ පර්චස් හතයි දශම නමයයි තුන (පර්. 7.93) විශාලත්වයෙන් යුත් ඉඩම සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි ඇතුළු සෑම සියලු දේද සමග වේ.

### දෙවන උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ (මීගමුව ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ) මීගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ මීගමුව මහනගර සභා සීමාවේ කොච්චිකඩේ, උපකාර්යාල සීමාව තුළ 72ඒ-දළුපොත ග්‍රාම නිලධාරී වසම තුළ දළුපොත පිහිටි "පල්ලන්සේනකුරුඳුවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ජේ. එඩ්ගාර් ද සිල්වා විසින් සාදන ලද අංක 4687 හා 1987.07.19 වැනි දින දරන පිඹුරේ ලොට් 7 වශයෙන් ලකුණු කර ඇති බෙදා වෙන්කරන ලද ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : ලොට් 6 ද, නැගෙනහිරට : බලයලත් මිනින්දෝරු ඒ. සී. එස්. ගුණරත්න විසින් සාදන ලද අංක 3526 හා 1955.10.06 දින දරන පිඹුරේ ලොට් බී ද, දකුණට : ලොට් 8 සහ බස්නාහිරට : අඩි 66ක් පළල පාර ද මායිම් වූ පර්චස් පහයි දශම හතයි හතර (පර්.5.74) විශාලත්වයෙන් යුත් ඉඩම සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි ඇතුළු සෑම සියලුදේද සමග වේ.

ඉහත සඳහන් දේපළ මෑතකදී නැවත මැනීමකට ලක්කරන ලද අතර, ඒ අනුව එය, බලයලත් මිනින්දෝරු ඩී. එම්. එච්. බණ්ඩාර විසින් සාදන ලද අංක 3103 හා 2014.11.25 වැනි දින දරන පිඹුරේ දක්වා ඇති අතර, එය පහත සඳහන් පරිදි විස්තර කෙරේ.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, (මීගමුව ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ) මීගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ මීගමුව මහනගර සභා සීමාවේ කොච්චිකඩේ උපකාර්යාල සීමාව තුළ 72ඒ - දළුපොත ග්‍රාම නිලධාරී වසම තුළ දළුපොත පිහිටි "පල්ලන්සේන කුරුඳුවත්ත" නමැති ඉඩමට සාදන ලද එකී අංක 3103 දරන පිඹුරේ ලොට් 1 වශයෙන් ලකුණු කර ඇති බෙදා වෙන්කරන ලද ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : ඒ. රෝහිණී ප්‍රනාන්දු හිමිකම්පාන ඉඩම (අංක 4687 පිඹුරේ ලොට් 6)ද, නැගෙනහිරට : පාර (අඩි 10ක් පළල) ද, දකුණට : ඒ. ආර්. හෙලන් ප්‍රනාන්දු විසින් හිමිකම්පාන ඉඩම (අංක 4687 පිඹුරේ ලොට් 8) සහ බස්නාහිරට : බේස්ලයින් පාර සහ වෙන්කිරීම ද මායිම් වූ පර්චස් පහයි දශම හතයි හතර (පර්.5.74) විශාලත්වයෙන් යුත් ඉඩම සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි ඇතුළු සෑම සියලු දේද සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි.

කේ. ඒ. එල්. ටී. රණවීර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී
(නීති)/මාණ්ඩලික ලේකම්.

07 - 15/4

---

### පෑන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී -කළුතර ශාඛාව

1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මුතිය පිළිබඳ දැන්වීමයි

ගණුදෙනුකරුවන්ගේ නම් :
පොතුපිටියගේ සේනාධි වසන්ත කුමාර ප්‍රනාන්දු
පහලගේ *හෙවන්* පල්ලගේ කුමුදුනී ධම්මිකා දිසාරත්න

පෑන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනාව වර්ෂ 2022.04.26 වැනි දින විශේෂයෙන් සහ ඒකමතිකව සම්මත කර ගන්නා ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

එනම්, පොතුපිටියගේ සේනාධි වසන්ත කුමාර ප්‍රනාන්දු බන්ධනදායී/උකස්කරු සහ පහලගේ *හෙවත්* පල්ලගේ කුමුදුනී ධම්මිකා දිසාරත්න බන්ධනදායී වශයෙන් ලියාපදිංචි අංක පී.කිව්. 48 දරන පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී නමට ප්‍රසිද්ධ නොතාරිස් ඒ. වී. එන්. චන්දිමා විසින් ලියා සහතික කරන ලද වර්ෂ 2016.08.08 දිනැති අංක 417 දරන උකස්කරය මත ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් ද,

එකී අංක 417 දරන උකස් බැඳුම්කරය මත ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිම කරන දින තෙක්, වර්ෂ 2022.03.31 දින දක්වා මුල් මුදල සහ පොළිය වශයෙන් රුපියල් අට මිලියන දෙලක්ෂ අනූතුන් දහස් හත්සිය තුනයි ශත හැත්තෑ නවය (රු. 8,293,703.79)ක මුදල සහ වර්ෂ 2022.04.01 වැනි දින සිට රු. 7,321,437.68ක මුදල මත වාර්ෂිකව 16% බැගින් පොළිය සහ වර්ෂ 2022.03.31 දින දක්වා මුල් මුදල සහ පොළිය වශයෙන් රුපියල් එක් මිලියන දෙලක්ෂ හැත්තෑ එක් දහස් හැත්තෑ හතයි ශත හතලිස් තුන (රු. 1,271,077.43)ක මුදල සහ වර්ෂ 2022.04.01 වැනි දින සිට රු. 1,210,732.21ක මුදල මත වාර්ෂිකව 8.11% බැගින් පොළිය ද පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී (මෙහි මින්මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන) වෙත අයවිය යුතුව සහ ලැබිය යුතුව තිබෙන හෙයින් ද,

පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගනු ලැබේ. ඒ කෙසේද යත්,

එකී අයවිය යුතු රුපියල් නව මිලියන පන් ලක්ෂ හැට හතර දහස් හත් සිය අසූ එකයි ශත විසි දෙක (රු. 9,564,781.22)ක මුදල ඉහතකී දිනයේ සිට විකිණීමේ දිනය දක්වා ඉහත සඳහන් පරිදි ලැබිය යුතු පොළියද, ගාස්තුද වර්ෂ 1990 අංක 4 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තිය යටතේ අයකර ගත හැකි මුදල් අයකර ගැනීම සඳහා පොතුපිටියගේ සේනාධි වසන්ත කුමාර ප්‍රනාන්දු සහ පහලගේ *හෙවත්* පල්ලගේ කුමුදුනී ධම්මිකා දිසාරත්න යන අය අංක 417 දරන උකස් බැඳුම්කරය යටතේ බැංකුව වෙත උකස්කර ඇති මෙහි උපලේඛනයෙහි වඩා සම්පූර්ණ ලෙස විස්තර කර ඇත්තා වූ දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොලොන්නාව, විහාර මාවත, අංක 182/3 (50/3) දරන ස්ථානයෙහි පදිංචි බලයලත් වෙන්දේසිකාර තුසිත කරුණාරත්න වෙත එකී වර්ෂ 1990 අංක 4 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය පරිදි අධිකාරය සහ බලය පවරන ලෙසය.

### උපලේඛනය

බස්නාහිර පළාතේ (පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයේ), කළුතර දිස්ත්‍රික්කයේ, වාද්දු වස්කඩු දෙබැද්ද, පානදුර තොටමුණ, කළුතර ප්‍රාදේශීය සභා සීමාව සහ කළුතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පොතුපිටිය - 708 C ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, පොතුපිටිය ග්‍රාමයේ පිහිටි කොළඹ පාර - වම වරිපනම් අංක 853 දරන "මාවතබොඩවත්ත" නම් වූ ඉඩමට බලයලත් මානක ජී. එස්. පෙරේරා විසින් සාදන ලද 1988 අප්‍රේල් මස 24 වැනි දින අංක 2991 දරන සැළැස්මේ නිරූපිත ලොට් 1 සහ 2 වශයෙන් ලකුණු කර බෙදා වෙන් කළ ඉඩමට මායිම්, උතුරට : ගලගහවත්ත සහ පිඹුරු අංක 405හි ලොට් 1 ද, නැගෙනහිරට : පිඹුරු අංක 405හි ලොට් 1 සහ ප්‍රධාන පාර ද, දකුණට : පිඹුරු අංක 405හි ලොට් 3 ද සහ බස්නාහිරට : පිඹුරු අංක 405හි ලොට් 2 ද යන මායිම් තුළ පිහිටියා වූද ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් හතරයි දශම හය (රූ.01, පර්.4.60)ක බෙදා වෙන් කළ ඉඩම සහ ඒ මත පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වැවිලි සහ ඒ මත පිහිටි සෑම සියළු දේත් ය. එකී ඉඩම පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙලුම්/පත්ඉරු C 78/107 හි ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂක මණ්ඩලයේ අණ පරිදි,

දේවිකා හල්වතුර,
කළමණාකාරිණි - ණය අය කරගැනීම්.

07 - 36

---

## පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී - කදුරුවෙල ශාඛාව

